## විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - 2015

-----------------------------------------

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල වෙනුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දරන ලද රු.1,304,400 ක වියදම් අරමුදලේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ වියදම් ලෙස සලකා තිබුණි.

(ආ) විශ්වවිද්‍යාල පනතේ 94 වගන්තිය ප්‍රකාර දායකයකුගේ වංකභාවය හෝ නොසැලකිල්ල හේතු කොටගෙන උසස් අධ්‍යාපන ආයතනයකට යම් පාඩුවක් හෝ හානියක් සිදු වුවහොත් එම මුදල අර්ථසාධක අරමුදලේ එම දායකයාගේ බැරට ඇති මුදලට ප්‍රථම වැය බරක් වුවද ගිවිසුම් කඩ කිරීම වෙනුවෙන් අරමුදලට ලැබිය යුතු මුදල් ප්‍රමාණය හඳුනාගෙන ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට විවිධ හේතූන් මත ගෙවීම් නවතා ඇති අර්ථසාධක අරමුදල් වටිනාකම වූ රු. 25,369,758 න් දායකයින්ගෙන් රජයට අය විය යුතු මුදල් අයකර ගෙන ඉතිරි මුදල් ඔවුන් වෙත නිරවුල් කළයුතු ශේෂය වසර 1 සිට වසර 14 ක කාල පරාසයක් තුල පරිශේෂව පවතින නමුත් ඉල්ලුම්පත්‍රවල පැවති අඩුපාඩු හේතුවෙන් මෙම මුදල නිරවුල් කරගත නොහැකි බව අරමුදල විසින් විගණනයට දන්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ දී උසස් අධ්‍යාපන ආයතන දෙකකින් ලැබිය යුතුව තිබුණු එකතුව රු.222,681ක අර්ථසාධක අරමුදල් දායකයන් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීතිරීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1999 අප්‍රේල් 09 දිනැති අංක අමප/99/0438/11/033 දරන අමාත්‍ය මණ්ඩල තීරණය. | අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩියෙන් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට බැර කිරීම හේතුවෙන් අර්ථසාධක අරමුදලට බැර වන ප්‍රමාණය අඩුවී තිබුණි. |

(ආ) 2015 අංක 01 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් නියමාවලිය

| | |
|---|---|
| **(i)** 08 ඡේදය | අරමුදලේ ආයෝජන තීරණ වලට සම්බන්ධ වන ආයෝජන කමිටුවලට ගෙවනු ලබන දීමනා අරමුදලේ වියදම් ලෙස අවශෝෂණය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. |
| **(ii)** 10 ඡේදය | අරමුදලේ කටයුතු යම් නිශ්චිත කාලපරාසයකට වරක් සමාලෝචනය කිරීම සඳහාද අරමුදලේ ප්‍රතිපත්තිමය කරුණු පිලිබඳ කොමිෂන් සභාව වෙත උපදෙස් ලබා දීම සඳහාද කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන අරමුදලේ අධීක්ෂණ මණ්ඩලයක් සිටිය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එවැනි අධීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 2,545,061,004 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,512,880,552 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.32,180,452ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ආයෝජන ආදායම් රු. 5,374,353 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂයේදි අරමුදලේ ජංගම වත්කම් අනුපාතය 14:1 ක් වූ අතර ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ජංගම වත්කම් අනුපාතය සියයට 88 කින් වර්ධනය වි තිබුණි. කෙටිකාලීන තැන්පතු රු. 2,502,000,000 කින් ඉහළයාම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන විසින් දායකයන්ගේ වාර්තා හා වගකීම් ප්‍රකාශන, අර්ථසාධක අරමුදල වෙත සැපයීමේ ප්‍රමාදයන් හේතුවෙන් අර්ථසාධක අරමුදල් ශේෂයන් 17ක් නිරවුල් කිරීමට වසර 6ක් දක්වා වූ කාල ප්‍රමාදයක් නිරීක්ෂණය වුවද මෙම තත්ත්වය අවම කර අරමුදලේ ගෙවීම් යාවත්කාලීන කිරීමට පසු විපරම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2015 වර්ෂය තුළදී අර්ථසාධක අරමුදල් ශේෂය ඉල්ලුම් කළ දායකයින් තුල ගිවිසුම් හා බැඳුම්කර කඩ කළ නිළධාරීන් 17 දෙනෙකුගෙන් රු.41,230,956 ක් අයවිය යුතුව තිබුණි. එම නිළධාරීන්ගේ අර්ථසාධක අරමුදලේ ශේෂය එකතුව රු.17,515,669 ක් වූ බැවින් අර්ථසාධක අරමුදල් ශේෂය ඉක්ම වූ රු. 23,715,287 ක් තවදුරටත් උසස් අධ්‍යාපන ආයතන වෙත අයවිය යුතුව ඇති බව විගණනයේ දී නිරීක්ෂණය විය. කෙසේ වුවද අර්ථසාධක අරමුදලෙන් අදාල ආයතන වෙත අයවිය යුතු මුදල් අයකර, විශ්වවිද්‍යාල වෙත දැනුම්දීම් ප්‍රමාදවීම හේතුවෙන් එම නිළධාරීන්ගේ ඉතිරි ශේෂ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට නොහැකි වී තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------------

හිඟ ජීවන වියදම් පියවීම සඳහා 2012 සහ 2014 වර්ෂයන්හි භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.525,000,000 න් 2015 දෙසැම්බර් 31 දිනට රු.104,893,466 ක් අදාල කාර්යයෙහි යොදවා නොතිබුණු අතර, ඒ සඳහා විශ්වවිද්‍යාල වලින් අවශ්‍ය වාර්තා ගෙන්වා ගෙන අදාල මුදල් නිරවුල් කිරීමටද කටයුතු කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ලේකම්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) හිඟ ජීවන වියදම් පියවීමට භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල් අදාල කාර්යයෙහි යෙදවීම.

(ආ) දායක මුදල් අයකර ගැනීම හා අර්ථසාධක අරමුදල් ශේෂයන් නිදහස් කිරීමේ ප්‍රමාදයන් අවම කිරීම.